# ඊළාමය සිහිනයක්ම බවට පත්කරමු!

**♦ සංජය විමලරත්න විසිනි**
**Sanjaya Wimalaratne**

*ප්‍රභාකරන් තම්බි සාදා දෙන්නට යන ඊළාමයට ගොස් පදිංචි වෙන්නට කලක සිට කරුනානිධි ට්‍රැවල් බෑග් සූට්කේස් ලෑස්ති කරගෙන සිටියේය. ප්‍රභාකරන්ගේ මරණයත් එල්ටීටීඊයේ විනාශයත් සමග තම හීනය බිඳවැටුණු බව කරුණානිධිට අවබෝධ විය.*

## LET US TURN THE EELAAM INTO ONLY A DREAM
### from the main external enemy !

Eelaam is only a dream! This the truth about it as uttered by one of its biggest exponents and activists, Muthuvel Karunanidhi himself, as was reported a week or so ago. Everybody was under the impression that all his frolics in the last few years were in its cause. But really it remains only a dream.

**Tamil Diaspora activists take note!**

**රජයට පක්ෂපාතිත්වය දක්වන බොහෝ දෙනා ද, රජයට හේත්තුවී සිටින පණ්ඩිතයින් ද වහළවල් උඩ ඉඳගෙන කොපමණ කෑ ගැසුවද ජිනීවාහි මානව හිමිකම් සමුලුවේදි අප ලද පරාජය සැබෑ පරාජයක්ම බව පිළිගත යුතු ය.**

**යුද්ධය නිමාවූ පසු අපේ නායක කාරකාදීන්ගේ හැසිරීම හරියටම බිග් මැච් එකක් දිනූ පාසැල් ශිෂ්‍යයින් හැසිරෙන පිස්සු විකාර බොළඳ ආකාරයමය.**



Karunanidhi කරුණානිධි




Some Sri Lanka-friendly foreigners show support in Geneeva
*ලංකාවට ලැදි විදේශිකයින් කීපදෙනක් ජිනීවා හි සහයෝගය දක්වමින්*

## කරුණානිධිගේ බිඳවැටුණු සිහිනය

ඊළම් හෙවත් ඊළාමය සිහිනයක් පමණකි. මෙසේ කියන්නේ ඊළාමය යම් කිසි දිනක සාක්ෂාත් කරගන්නට මෙතෙක් සිහින මැවූ, තවමත් සිහින මවන, ඊළම් ක්‍රියාකාරී බව මුළු ජීවිතය පුරාම පෙන්නා ඇති තමිල්නාඩුවේ කරුණානිධිය.

ජයලලිතාට පෙර තමිල්නාඩුවේ සිටි මහඇමති ඔහුය. මේ අවසාන අවුරුදු කීපය තුළ කරුණානිධි දැහලූ දැහලිල්ල සහ ප්‍රකාශ කළ දේවල් ආදියෙන් ප්‍රකටවුණේ ඔහු මේ සූදානම් වන්නේ අද හෙටම ප්‍රභාකරන් පිහිටුවන ඊළාමය ඉතාම සත්‍යයක් හා සැබෑවක් බව අන් කාටත් වඩා ඇස්පනාපිටම දැක ඇති නිසා එහි පදිංචි වෙන්නට යන්නට ගමන් බෑග්, සූට්කේස් ලෑස්තිකරන බවකි. ප්‍රභාකරන්ගේ මරණයත් එල්ටීටීඊයේ විනාශයත් සිදුවූ විට කරුණානිධිට වැටහුණේ ඒ ඊළම සිහිනයක්ම පමණක් බවය.

## ජිනීවා හි සිදුවීම්

අප දන්නා පරිදි එල්ටීටීඊයට අප රට තුළ තිබූ යුදමය බලය මුළුමනින්ම නසා දමා එල්ටීටීඊ නායකත්වයද සුණු විසුණු කර දැමීමෙන් පසු ඊළම් හිතවාදී සතුරෝ ශ්‍රීලංකා රජය හා සිංහළ ජනතාව සමග පසුවන්නේ දැඩි වෛරයෙනි. නොයෙක් නොයෙක් රටවල විසිරී සිටිනා එල්ටීටීඊ හිතවාදී කොටස් ඇමරිකාව ද ඇතුලු බටහිර රටවල ඇතැම් දේශපාලුවන්ගේ ද සහාය ඇතිව ශ්‍රීලංකාවට එරෙහි බාහිර සතුරු බලවේගයක් ගොඩනගන්නට දැඩි මහන්සියක් ගනිති. ශ්‍රීලංකාව ඇතුළතද ඊට සමරූපීව සතුරු කඳවුරක් හැදීගෙන යන හැටි අපට හොඳින් පෙනේ. වර්තමාන රජයට එරෙහිව රට ඇතුළතම බලවේගයක් ගොඩනගන්නට මේ අවස්ථාවාදීහු මහන්සි ගනිති. මෙහි පෙරමුණේ සිටින්නේ **TNA** හෙවත් දෙමළ ජාතික සන්ධානයයි. ශ්‍රීලංකාවේ ඉංග්‍රීසි බසින් පළවන ලීඩර් වැනි පුවත්පත්ද රජයේ වැරදි අපක්ෂපාතීව විවේචනය කරන බව පෙන්වන නියායෙන් මෙම සතුරු බලවේගය ගොඩනගන්නට රුකුල් දෙති. තවමත් පිටරට සල්ලි වලින් යැපෙන, දැන් එය තම ප්‍රධාන ජීවනෝපාය කරගෙන සිටින විදේශගැති නිදහස් මාධ්‍යකරුවන් පිරිසක්ද මෙයට එකතුව සිටිති. නොයෙක් ආකාරයේ වෙබ් අඩවි සාදාගෙන අසත්‍ය කතා ගොඩනගා ලොපුරා යවමින් තම රට හා ජනතාව බාල්දුකරති. වසර **30** ක් කුරිරු යුද්ධයකින් පසු රට යථා තත්වයට ගෙන එන්නට ගන්නා මහන්සියක් ගැන මේ හැත්ත කිසිවක් කතාකරන්නේ නැත.

සති තුනකට පෙර අප ජිනීවාහි සිදුවනු දුටුවේ පසුගිය අවුරුදු තුන පුරා ඔවුන් ගෙනගිය විෂම ක්‍රියාවලිය උච්ච අංශකයකට ගෙන ඒමයි. යුද්ධය අවසන් වූ පසු ඉහතකී ප්‍රතිගාමීන්ට සිය බඩවියත රැකගන්නට තිබෙන එකම මග ශ්‍රීලංකාවට එරෙහිව ගෙනියන ව්‍යාපාරය තුළින් යළි ඊළම් සිහින නාටකය පණගසා කරළියට ගෙන ඒමය. මෙවර එය ව්‍යවර්ථ වුවහොත් ඔවුනට ජීවිතය ගැටගසා ගන්නට විදියක් නැතිවෙන බව ඔව්හු දනිති. ජිනීවාහි වේදිකාවට ගෙන ආවේ ඒ නාටකයයි.

පටන් ගැන්මේදී ඇමරිකාව ශ්‍රීලංකාවට එරෙහිව තර්ජනාත්මකව හැසිරෙමින් ශ්‍රීලංකාවේ තත්වය විමසීමටය කියා විශේෂ ඇමරිකානු නියෝජිතයෙකුද ලංකාවට එවීය. අපි මේ බව අපගේ පෙබරවාරි කලාපයෙන් අනාවරණය කළෙමු.

එක්සත් ජාතීන්ගේ සමුළුව ඇරඹූ මුලදී එහි පළමු වටයෙන් පෙනුනේ ඇමරිකාව අපේ රජයේ ප්‍රධානීන් හා හමුදා ප්‍රධානීන් ජාත්‍යන්තර යුද අධිකරණයට ඇදගෙන යන්නට සැරසෙන බවකි. මේ තත්වය යටතේ ලංකාවට එරෙහි සතුරෝ ද සමුලුව අසල රැස්වී ඇමරිකාවේ තැතට තල්ලුව දෙමින් සති හතරක්ම කෑකෝ ගසමින්, පෝස්ටර් ප්‍රදර්ශණය කරමින් විශාල කල බැගෑනියක් කළහ. බටහිර මාධ්‍ය නාලිකාවන්ද ඒවා උලුප්පා පෙන්වමින් ප්‍රචාරය දුන්හ. එහෙත් සමුළුව අවසානයේ ඇමරිකාව හැකි ඉක්මනින් උගත්පාඩම් කොමිසමේ වාර්තාවට අනුව ක්‍රියාකරන් නැයි ලංකාවෙන් ඉල්ලමින් පමණක් යන්නට ගියේය. එතන රැස්වී උද්ඝෝෂණය කළ පිරිසද අකුලාගෙන යන්නට ගියෝය. උද්ඝෝෂණයෙන් වෙච්ච දෙයක් නැත.

නමුත් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සමුලුවට ඉදිරිපත්කර තිබුණු යෝජනා ඉතා සුපරීක්ෂාකාරීව විමසා බැලුවහොත් එහි ඉතා කපටි අන්දමින් ඔවුන් වගන්ති දෙකක් ඇතුළත්කර ඇතිබව පෙනේ. ඒවා නම්

**1.** මානව හිමිකම් මණ්ඩලයට ලංකාව ඉහතකී වාර්තාව ක්‍රියාත්මක කරන්නේදැයි සොයා බලන්නට අයිතියක් ඇති බව

**2.** ඔවුන්ගේ අවවාද අනුව ඒවා ක්‍රියාත්මක කිරීමට ලංකාව කටයුතු කළ යුතු අතර අවශ්‍ය විටක මණ්ඩලයට ඊට මැදහත්වීමට ද අවශ්‍ය ඉඩ ලංකාව දිය යුතු බව.

අපේ සමහර පණ්ඩිතයින් සමුලුවේ අවසානය ලංකාවට අත්වූ ජයග්‍රහණයක් යයි මෝඩ ලෙස උදම් අනතත් අප දැනගත යුතු වැදගත්ම කරුණ නම් මෙම බටහිරයන් කොතරම් සූක්ෂම ලෙස අපේ වළ කැපීමට සැළසුම් කරනවාද යන්නයි. ඒ ගැන අප වඩාත් පරෙස්සම් විය යුතුය.

## අපට දැන් ඉගනගන්නට තිබෙන පාඩම්

උගත් පාඩම් වාර්තාව පැත්තකට දාමු! මානව හිමිකම් සමුලුවේ සිදුවූ සියල්ල ද, ඡන්ද විමසීමෙන් ලංකාවට අත්වූ පරාජයද අපේ රටේ නායකයින්ට හොඳ පාඩමකි. අපේ රජයට පක්ෂපාතිත්වය දක්වන බොහෝ දෙනා ද, රජයට හේත්තු වී සිටින, ඕනම දෙයක් දන්නවාය කියන පණ්ඩිතයින් ද වහළවල් උඩ ඉඳගෙන කොපමණ කෑ ගැසුවද සමුලුවෙන් අප ලද පරාජය සැබෑ පරාජයක්ම බව පිළිගත යුතුය.

එසේම අපේ ගෙදර වැඩ ටික හරියට කරගෙන එහි ගියා නම් හා කුමක් විය හැකිදැයි කලින්ම වටහාගෙන ඒ අනුව සැළසුම් වී නම් කාරිය වඩා හොඳ අතට හැරෙන්නට පමණක් නොව, ඡන්දයෙන් අපට දිනන්නටද අවස්ථාව තිබිණ.

අප දැන්වත් උගත යුතු පාඩම් මේවාය. අපට වැරදුණු තැන් මේවාය.

**1.** 2009 යුද ජයග්‍රහණයෙන් පසු අප තත්වය මැන බැලිය යුතුව තිබිණ. අපේ සතුරන් ලොව වටා සිට අපව කන්නට මාන බලන බව අපි දැන සිටියෙමු. එහෙත් අපේ නායකයෝ තමා වටා කරකැවෙන පන්දම් කාරයින්ගේ ඉච්ඡා චාටු බස්වලින් අනවශ්‍ය ලෙස උදම් වෙමින් ඇතින් සිට බලා සිටින අන්තරාය නොදුටුහ. නැතහොත් ගණනකට ගත්තේ නැත. අපේ නායක කාරකාදීන්ගේ හැසිරීම හරියටම බිග් මැච් එකක් දිනූ




පාසැල් ශිෂ්‍යයින් පාරේ හැසිරෙන පිස්සු විකාර බොළඳ ආකාරය ම ය.

**2.** අප යුද්ධය දිනුවේ මුලු මහත් රටම, මුලුමහත් දේශ ප්‍රේමී ජනතාවම යුද්ධය ජයග්‍රහණය කිරීමේ ඉලක්කය සඳහා එකමුතුව ක්‍රියාකළ නිසාය. මෙය හොඳින් දුටු අපේ අභ්‍යන්තර සහ බාහිර සතුරෝ පසුබා මඳක් ඈතට වී එහෙත් කොයි මොහොතක හෝ තමන්ට චාන්ස් එකක් එනතුරු සුපරීක්ෂාකාරීව බලාගෙන සිටියෝය.

**3.** බලයේ සිටිනා නායයෝ යුද ජයග්‍රහණයෙන් මත්ව අප ඉතින් යළිත් පරාජය කරන්නට මොන ජගතෙකුටවත් බැරිය යන සිතුවිල්ලෙන් තමාම රවටාගත්හ.

**4.** අප බොහෝ හොඳ දේවල් ද කළෙමු.

එනම් : අවතැන් වූවන් **300,000** ආරක්ෂිතව යළි පදිංචිකරවීම, බිම්බෝම්බ ඉවත්කර ඒ ප්‍රදේශ සුරක්ෂිත කිරීම, උතුරු නැගණහිර විනාශවුණු ගොඩනැගිලි යළි ඉදිකිරීම, අත්අඩංගුවට ගත් කොටි තරුණ තරුණියන් පුනරුත්ථාපනය කිරීම, උතුරට නිවාස හා ජලය විදුලිය සැපයීම කඩිනමින් යථාතත්වයට ගෙන ඒම

ආදිය ඉන් කීපයකි. එහෙත් මේ කිසිවකට අප අවශ්‍ය තරම් ප්‍රචාරය පිටට දුන්නේ නැත. එම දුර්වලකම රජයට වූ විශාල අවාසියකි.

## ඉතාම දුර්වල අපේ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශය සහ අපේ තානාපති සේවය

අපේ විදේශ කටයුතු අමාත්‍යංශය ඉතා දුර්වලය. අපේ විදේශීය තානාපති සේවය ඉතා අසාර්ථකය. පසුගිය අවුරුදු 30 ක් පුරා පැවති යුද සමයේදී විදේශයේ ඇති අපේ තානාපති කාර්යාල නිසිපරිදි කාර්යක්ෂම නිලධරීන් විසින් ක්‍රියාත්මක කරන ලද්දේ නම් අපට විදේශයෙන් වූ කරදර, ප්‍රශ්න හා චෝදනා ආදියට හරිහැටි පිළියම් යොදන්නට තිබුණි. එහෙත් ඒ යුගයේදී ලොව වටා තිබූ අපේ තානාපති කාර්යාල වලින් තඹ සතේක වටිනා දෙයක් සිදුවූයේ නැති බව පිටරට සිටින අපි හොඳින් දුටුවෙමු. ඒ දුර්වල තානාපති සේවයන් හේතුකොටගෙන දෙමළ ඩයස්පෝරාව සහ කොටි හිතවාදීහු විදේශයේ කැපී පෙනෙන්ට වූහ. ලංකාවේ රජයයන්ට විදේශයට ගිය ලංකා තානාපතිවරුන්ගෙන් අපේක්ෂා කළ සේවය ලැබුණේ නැත. අප යුද්ධය දිනුවත් එය ලෝකයා හමුවේ නොවටිනා බවට පත්වූයේ ඒ නිසාය.

රජයට හිතවත් වූ පමණින් හා පන්දම් ඇල්ලූ පමණින් තානාපති සේවය ගැන උඩ බිම නොදන්නා, හෙට අනිද්දා විශ්‍රාම යන්නට සිටින අය තනතුරු දී යවන්නේ නැතිව, දැනුම් තේරුම් ඇති, කාර්යක්ෂම, විදේශීය ප්‍රශ්න වලට හරිහැටි අතගැසිය හැකි නිලධාරීන් පිටරට තානාපති සේවයන් සඳහා යැවීමට දැන්වත් රජය ඉටාගත යුතුය.

එසේම ඊළඟ වසර 3 පුරා අපේ විදේශ අමාත්‍යංශය තුළ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩලය වෙනුවෙන් වෙනම ම අංශයක් පිහිටුවා දැන් සිටම ඒ ඉදිරියේදී ඒවියයි සිතිය හැකි තත්වයන්ට මුහුණදීමට අප රට ලකලෑස්ති විය යුතුය. එසේම ඒ කටයුත්ත වහාම පටන් ගත යුතුය. එය ශ්‍රීලංකා රජය සැලකිල්ලට ගන්නවා ඇතැයි අපි අපේක්ෂා කරමු.

## උගත්පාඩම් වාර්තාව LLRC සිංහලෙන් නැත්තේ ඇයි?

යුද්ධයෙන් පසු ජනවාර්ගික පිළියම් සෙවීම පිණිස වර්තමාන ශ්‍රීලංකා රජය කොමිසමක් පත් කළාය. එය කවුරුත් දනිති. එහි නම **Lesson Learnt & Reconciliation Commission** හෙවත් **උගත් පාඩම් සහ සංහිඳියා කොමිසම** යනුවෙන් සිංහළෙන් හඳුන්වති. රජය පත්කළ මෙම කොමිසම උතුරු නැගණහිරට (හෙලිකොප්ටර්වලින්) ගොස් කරුණු සොයා, රජයේ භාණ්ඩාගාරයේ මුදල් රුපියල් කෝටි ගණනක් වැයකර, අවුරුදු එක හමාරක් තිස්සේ සාක්කි (ඉංග්‍රීසියෙන්) අසා බිහි කළ වාර්තාව මෙයයි. දැන් එය ක්‍රියාත්මක කරන්නයයි එය ක්‍රියාත්මක කරන්නයයි ඇමරිකාව කියයි. ඉන්දියාව කියයි. ජිනීවාවලින් කියයි. හැමෝම කියති. එහෙත් ඒ වාර්තාවේ තිබෙන්නේ මොන වාදැයි සිංහළ මිනිස්සුවත්, ගම් පළාත්වල මන්ත්‍රීලාවත්, බොහෝ දෙමළ මිනිසුන්වත් කිසිවක් දන්නේ නැත. මක් නිසාද එය ඉංග්‍රීසියෙන් පමණක් පළකර ඇති නිසාය.

ඒ නිසා ඒ වාර්තාව සිංහළෙන් හා දෙමළෙන් පළකර ඒ මිනිස්සුන්ට කියවන්නට දෙන්නටයයි අපි රජයෙන් ඉල්ලා සිටිමු. රට වාසීන්වත් නොදන්නා දෙයක් ක්‍රියා කරවන්නට තැත් කරන වෙනත් කිසිම රටක් ලෝකයේ කොහේවත් නැත. ලංකාව විතරය.